**මඩකලපුව මහනගර සභාව - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මඩකලපුව මහනගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහනගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහනගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහනගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,  ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය  ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහනගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහනගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහනගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පළාත් සභාවෙන් ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණය රු.13,005,946ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ඊළඟ මූල්‍ය ප්‍රකාශනයේ වැටුප් ප්‍රතිපූර්ණය කිරීම් ලැබිය යුතු ලෙස අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු දෑ වත්කම් ලෙස ගිණුම්වල අනාවරණය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ඉටුකළ ව්‍යාපෘති සඳහා පළාත් සභාවෙන් ලැබිය යුතු රු.2,296,382ක් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස අනාවරණය කර නොතිබුණි. | ලැබිය යුතු මුදල පිළිබඳව පළාත් සභාවේ ඉංජිනේරු අංශයෙන් ලබාගෙන ඊළඟ මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු දෑ වත්කම් ලෙස ගිණුම්වල අනාවරණය කළ යුතුය. |
| (ඇ) | සභාවට අයත් මහජන පුස්තකාලවලට සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් රු. 892,680ක් වටිනා පොත් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ නමුත්, ඒවා ගිණුම්වල වත්කම් ලෙස අනාවරණය කර නොතිබුණි. | පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ පොත් දෝෂයකින් අත්හැරී තිබුණි. මෙම වර්ෂයේදි මේවා වත්කම් ලෙස හෙළිදරව් කිරීමට පියවර ගනු ලැබේ. | පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ පොත් වත්කම් ලෙස ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවසථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් | අවශ්‍යතා සඳහා තැන්පත් කළ වර්ෂ 02 කට අධික කාලයක් ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවැති රු.3,115,424ක | විවිධ වූ තැන්පතු ආදායමට මාරුකර ඇති අතර ඉතිරි තැන්පතුද අදාල අයට ගෙවීමට හෝ | තැන්පතු නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග |

| | | |
|---|---|---|
| රෙගුලාසි 571 | තැන්පතු නියාදනය නොතිබුණි. | ආදායමට මාරු කිරීමට ගතයුතු වේ. කටයුතු කරනු ලැබේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.153,674,005ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 117,648,379ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ සියළුම ආදායම් රැස්කිරීම්වල කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ කිහිපයක සිට හිඟහිටිව පවතින කඩකුලී සහ බදුකුලී රු. 4,521,815ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකිරිමට පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි මුදල් ගෙවීම් පැහැර හැරි අයට එරෙහිව නඩු පවරා ඇත. ගෙවීම් පැහැර හැරී අනෙකුත් බදුකුලි හිමිකරුවන්ට එරෙහිවත් නඩු පැවැරීමට අවශ්‍ය ලියකියවිලි මහනගර සභාවේ නීතිඥවරයාට භාරදී ඇත. | හිඟහිටිව පවතින කඩකුලි සහ බදුකුලී අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

මහනගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජීව වායු සැකැසීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 02ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ජීව වායු නිෂ්පාදනය හා භාවිතය සඳහා සභාව විසින් විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි. | ජීව වායු සැකැසීමේ ව්‍යාපෘතියට බෙදාහැරීමේ බහාලුම්වල පිරවීමේ තාක්ෂණික පහසුකම් නොමැති නිසා ක්‍රියාත්මක කළ නොහැකිව පවතී. | ජීව වායු සැකැසීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඵලදායි පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඓරන් ඇති කිරීමේ ව්‍යාපෘතියට රු.1,480,066ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ආදායමක් සභාව විසින් උපයාගෙන නොතිබුණි. | මේ පිළිබඳව අප විසින් ලංසු කැඳවූ නමුත් කිසිඳු පිළිතුරු නොලැබීම නිසා නැවත ලංසු කැඳවා ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | පසුගිය වර්ෂ 04කට අදාළ සභා බලප්‍රදේශයේ ඉඩම් හුවමාරු මුද්දර ගාස්තු රු.15,939,000ක් උපලේඛන නිරවුල් කර නොගෙනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර නොතිබුණි. | මෙය ඉතා කඩිනමින් ලබාගැනීමට පියවර ගනු ලැබේ. | මුද්දර ගාස්තු නියමිත කාලපරිච්ඡේදය තුළ ලබාගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | මහනගර සභා බලප්‍රදේශයේ පුද්ගලික ඉඩම් කට්ටිකර විකිණීමේදී මහනගර සභාවට භාර දී තිබූ පර්චස් 97ක වපසරියකින් යුතු ඉඩම් 05ක් හිටපු කොමසාරිස්වරයා විසින් ඔහුගේ සහ ඔහුගේ බිරිඳගේ නම්වලට 2003 වර්ෂයේ සිට 2006 දක්වා කාලපරිච්ඡේදය තුළ මාරුකර තිබුණි. මෙම කරුණ පිළිබඳව පසුගිය වර්ෂයේ විගණන වාර්තාවේ අනාවරණය කර තිබූ නමුත් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාල කාරණය පිළිබඳව ක්‍රියාමාර්ග වර්තමානයේ සිදුකෙරේ. | අදාල විමර්ශන සිදුකර මෙම දේපළ සභාවේ නමට මාරුකිරීමට නීතිමය පියවර ගත යුතුය. |
| (ඉ) | නැගෙනහිර පළාත් සභාව විසින් ලබාදුන් රු. 10,435,141ක පළාත් නිශ්චිත මූලධන ප්‍රදාන නියමිත අරමුණු සඳහා උපයෝජනය නොකර වර්ෂ 05කට අධික කාලයක් අඛණ්ඩව බැංකු ගිණුමක නිෂ්ඵල ලෙස තැන්පත් කර තිබුණි. | මෙම අරමුදල්, ආදායම් ඉපැයීමේ ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම සඳහා සභාවේ අනුමැතිය සහිතව පළාත්පාලන කොමසාරිස් වරයාගේ අනුමැතිය සඳහා යවා ඇත. | අරමුදල් නියමිත අරමුණු සඳහා උපයෝජනය කළ යුතුය. |
| (ඊ) | සභාව විසින් බදුදී තිබූ නිවාඩු නිකේතන සම්බන්ධයෙන් 2013 සිට 2018 කාලපරිච්ඡේදය දක්වා අයකළ යුතු රු.507,000ක් හිඟහිටි බදුකුලී අයකිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ දක්වා බදු මුදල් ගෙවීමට කටයුතු නොකිරීම නිසා නඩු පැවැරීමට සභාව විසින් තීරණය කර ඇත. | හිඟහිටි අයකිරීමට නීතිමය පියවර ගත යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාවට අනුව මහනගර සභාව විසින් තනතුරු වර්ග 31කට අයත් පුරප්පාඩු 171ක් පුරවා නොතිබුණි. | සියළුම කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට පියවර ගැනීම සඳහා නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාට ප්‍රධාන ලේකම්වරයා මාර්ගයෙන් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | පුරප්පාඩු පිරවීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | විශ්‍රාම ගිය, මිය ගිය, වැඩතහනම් කළ සහ ස්ථානමාරුවී ගිය සේවකයින් 12ගෙන් අයකළ යුතු රු.557,812ක් ණය මුදල අදාල පුද්ගලයින්ගෙන් හෝ | විශ්‍රාම පාරිතෝෂිකයෙන්, ඇපකරුගෙන්, සේවකයින් ස්ථාන මාරුවී ගිය සම්බන්ධිත දෙපාර්තමේන්තුවලිනුත් හිඟ ණය | හිඟහිටි සේවක ණය ඔවුන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් |

| | | |
|---|---|---|
| ඇපකරුවන්ගෙන් අයකිරිමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | අයකිරිමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | අයකිරිමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි කාලයේදි වාර්ෂික කාර්යසාධන වාර්තාවද ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාවද ඉදිරිපත් කළ යුතු වේ. |

**4.2 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව මහනගර සභාව විසින් 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි. | 2030 වර්ෂයේ ළඟාකරගත යුතු සංවර්ධන න්‍යාය පත්‍රය පිළිබඳව මැනීම සඳහා දර්ශකයන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |